# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 57 — 1973 අප්‍රේල් 27 වැනි සිකුරාදා — 1973.04.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 525 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට තීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 528 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| කොට්ටපල් ඡන්ද හා වෙනත් ඡන්ද විකිණීම් ... ... | 529 | විවිධ දැන්වීම් ... ... ... | — |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ සහ ත්‍රිකුණාමල වරායවලින් නැව් බඩු නිෂ්කාෂණය කර නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය වෙත භාරදීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

1973.05.07 වෙනි දින පස්වරු 2 ට ටෙන්ඩර් භාරගැනීම අවසන් කෙරේ.

අයදුම් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත් සහ අනෙක් විස්තර ලබාගත හැක.

සාමාන්‍යාධිකාරි.

356, යුනියන් පෙදෙස,
කොළඹ 2, 1973.04.07.

04–684—73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

### නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

ටෙන්ඩර් දැන්වීමයි

ප්‍රවාහන සේවාවන් සඳහා මිල කැඳවීම් භාරගනු ලැබේ.

1973.05.08 වෙනි දින පස්වරු 2 ට මිල ගණන් භාර ගැනීම අවසන් වේ. අයදුම් ඉදිරිපත් කිරීමෙන් ආකෘති පත්‍ර සහ වෙනත් විස්තර ලබාගත හැක.

සාමාන්‍යාධිකාරී.

356, යුනියන් පෙදෙස,
කොළඹ 2,
1973.04.06.

04–683—73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

රජයේ ගොවිපල්වලට ඇඹුල් අඹ සැපයීම සහ ගෙනගොස් භාරදීම

අංක 52 හා 1973.3.23 දින දරණ ගැසට් පත්‍රයේ පළවී ඇති දැන්වීම පරිදි ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1973.4.30 දින පෙ. ව. 10 දක්වා දීර්ඝ කෙරේ. ටෙන්ඩර් පෝරම 1973.4.28 දින දහවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

මහ. ගු. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂි. ගොවිපල්).

1973 අප්‍රේල් මස 12 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

04–697—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජිද්‍රක පත්‍ර තිස්පත් ලක්ෂයක් සැපයීම

ජිද්‍රක පත් තිස්පත් ලක්ෂයක් සැපයීම සඳහා 1973 ජූනි මස 12 වැනි දින පෙ. ව. 10 දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත්‍ර සීල් තබා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කවරයේ ඉහළ වම් කෙළවරේ " ජිද්‍රක පත්‍ර සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම " යි සඳහන් විය යුතුය. ආදර්ශ ජිද්‍රක පත්‍ර ද ටෙන්ඩරය සමඟ එවිය යුතුය.

3. 1973 ජූනි මස 12 වැනි දින පෙ. ව. 10.05 ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර ලැබෙනවා ඇත.

**විශේෂ විස්තරය**

**තීරු 80 වේ ජිද්‍රක පත්‍ර :**

දිග : අඟල් 7.375+0.005 අඟල්
පළල : අඟල් 3.250+0.003 අඟල්
ඝනකම : අඟල් 0.0070+0.0004 අඟල්

සාපේක්ෂ ආර්ද්‍රතාව 50% දී සහ උෂ්ණත්වය පැරන්හයිට් අංශක 73 දී කොන් හතරැස් හෝ කවාකාර හෝ විය යුතුය. කවාකාර කොන්වල අරය 1/4" ක් විය යුතුය. කොන් සියල්ලම වක රැලිවලින් තොර විය යුතුයි. එක් කොනක් අංශක 60 ක් වන ලෙස කඩදාසිය මුදුණින් දිග අතට අඟල් 1/4 ක් ද, පැත්තෙන් අඟල් 3/8 ක් පමණට ද කැපිය හැක. ජිද්‍රක පත්‍ර කැපූ විට කඩදාසියේ වෙරම ජිද්‍රක පත්‍රයේ දිග අතට සිටිය යුතුය. ජිද්‍රක පත්වල විද්‍යුත් සන්නායන ස්ථාන ඇත්දැයි ඒවා විද්‍යුත් පරීක්ෂණයකට භාජනය කොට සදොස් ජිද්‍රක පත්‍ර ඉවත් කළ යුතුය.

**මුද්‍රණය :**

තීන්ත වැඩි නොවී මුද්‍රණය පැහැදිලි විය යුතුය. එමෙන්ම, මොන යම් හේතුවක් නිසාවත් ජිද්‍රක පත්‍රයේ මතුපිට හෝ පසු පිට නියම ස්ථානයෙන් ඉවත් නොවන ලෙස එය කඩතොලුවලින් තොරවිය යුතුය.

**පාට :**

ලා දුඹුරු පාටට හුරු කහ.

ටෙන්ඩර් කරනු ලබන මිල ගණන් එකක් හෝ සියල්ලම භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ සතුය.

එල්. බී. රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1973. 04. 11 දින,
කොළඹ 7, තැ. පෙ. 563,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දීය.

04–617—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

### අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ, [illegible]ටස් පාරේ පිහිටි ශීත ගබඩාවේ දැනට පාවිච්චි කරනු ශීතකරණ උපකරණ සහ යන්ත්‍ර වෙනුවට අළුතින් ඒවා සපයා සවිකිරීමට ටෙන්ඩර් පත් භාරගැනීම 1973 මැයි මස 23 වෙනි දින පස්වරු 2 දක්වා දීර්ඝ කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. අදාළ ටෙන්ඩර් ආකෘති පත්‍ර 1973.05.23 දින දහවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

04–614—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර කොට්ඨාශය

කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1973 ජූනි මස 1 දින සිට 1973 දෙසැම්බර් මස 31 වැනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරිතැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. එසේ වුවත්, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සමාගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, රත්නපුර සහ වවුනියා යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පතට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට, ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී, ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම් ලබා ගැනීමට කැමති සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැකිය. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 වන තීරය බලන්න.

(i) රෝගියකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස $3\frac{1}{2}$ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) දනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 9 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1972 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිලට මුදල් ගෙවිය යුතුයි.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කර ගනු ලැබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ :—

(අ) කූපන් වලට ලබා ගන්නා සහල් දනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන් වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩු කර ගනු ලැබේ.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, මාතර '' කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය. ටෙන්ඩර් පත්‍රිකා පෞද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කර ගත් දිනක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩර් තීරණය.**—ටෙන්ඩර් පත් තෝරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයෙහි '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි '' සී '' උපලේඛන යට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිල ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. **තැන්පත් මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරා ගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තුවන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දන ගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

එල්. එන්. ද එස්. ජයසූරිය,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 අප්‍රේල් මස 9 වැනි දින,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් | | | | | | | | | |
| ආයතනයේ නම | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින හා වේලාව | සේවකයින්ට | | | | | රෝගීන්ට | | | | |
| | රු. | රු. | | අලුක් මාලු | හරක් මස් | කරවල | එලවළු | බිත්තර | අලුක් මාලු | හරක් මස් | කරවල | එලවළු | බිත්තර |
| (1) ඌරුබොක්ක ගැමි රෝහල හා මාතෘ නිවාසය | 100... | 600 | 1973 මැයි මස 14 වැනි දින පෙ.ව 10 | 250... | 250... | 250... | 1,000... | 250... | 1,150... | 1,100... | 1,100... | 4,350... | 1,100 |
| (2) කිරින්ද මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | 100... | 100... | 350... | 100... | 200... | 200... | 200... | 750... | 200 |
| (3) දෙයියන්දර මාතෘ නිවාසය | 100... | 600 | | 250... | 250... | 250... | 1,000... | 250... | 1,100... | 1,100... | 1,100... | 4,300... | 1,100 |
| (4) ගැටමාන්න මාතෘ නිවාසය | 100... | 300 | | 10... | 10... | 10... | 50... | 10... | 300... | 300... | 300... | 1,000... | 300 |
| (5) හකුරුවෙල මාතෘ නිවාසය | 100... | 300 | | 100... | 100... | 100... | 500... | 100... | 300... | 300... | 300... | 1,200... | 300 |

4–692—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

#### දැව වෙන්දේසි කිරීම

පොලොන්නරුව අඩවි වන සීමාව තුළ ඇති ඝන අඩි 1560.6 කින් සමන්විත හල්මිල්ල, බුරුත, රානේ, මිල්ල, කලුවර, දඹ යනාදී කඳන් 255 ක්ද, ඝන අඩි 988.4 කින් සමන්විත බුරුත, මිල්ල, හල්මිල්ල, රානේ, ඇටතිඹිරි, හුලංහික්, දඹ, තෙලඹු, මාදන්, හැලඹ යනාදී ඉරූ දැව කෑලි 1,832 ක්ද, දරමිටි 509 ක්ද, කම්බිකනු 9 ක්ද, තෝරනු ලැබූ දර කෑලි 7 ක්ද, ඇටඹ මරු 5 ක්ද, කියත් 8 ක්, කියත් අඬු 3 ක්, තුල් කෑලි 4 ක්, පිහිය 3 ක්, හරස් කියත් 2 ක්, පොරව 2 ක්, කුඹ 3 ක්, උදළු 1 ක්, අලවංගු 1 ක්, කැති 1 ක්, පිරි 1 ක්, අඩිකෝදු 1 ක් සහ පනිව්වුවක් ද 1973 මැයි මස 03 වැනි දින පෙ. ව. 10 ට පොලොන්නරුව අඩවි වන කාර්යාලයේදී උතුරු මැද දිසාවේ දිසා වන නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය ආරම්භ කිරීමට පෙරාතුව දැව/ද්‍රව්‍ය පරීක්ෂාකර බලන ලෙස ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නන් වෙන්දේසියට අදාල කොන්දේසිවලට අනුකූලතාවය දැක්විය යුතුය. වෙන්දේසිය පිළිබඳ වැඩිමනත් විස්තර සඳහා පහත අත්සන් කරන අයගෙන් හෝ පොලොන්නරුව අඩවි වන නිලධාරිගෙන් විමසිය යුතු වේ.

නා. සිත්තම්පලම්,
උතුරු මැද දිසාවේ දිසා වන නිලධාරී.

4–707—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

### වන රක්ෂණ දෙපාර්තමේන්තුව

#### දැව වෙන්දේසි කිරීම

කහටගස්දිගිලිය අඩවි සීමාව තුළ ඇති ඝන අඩි 162.5 කින් යුත් බුරුත, පලු, මිල්ල, හල්මිල්ල, හුලංහික්, හුරිමාර යනාදී කඳන් 20 ක්, ඝන අඩි 90.4 කින් යුත් මිල්ල, රානෙ, බුරුත, හුලංහික්, පලු, වෙලං යනාදී ඉරූ දැව කෑලි 149 ක්, 1 පන්තියේ වටකනු 54 ක්, 2 පන්තියේ වටකනු 52 ක්, කැති 4 ක්, කියත් 3 ක්, අඩිකෝදු 2 ක්, පිහිය 1 ක්, පොරව 4 ක්, ලොකු කියත් 1 ක්, උදළු 1 ක් සහ අඬුවක් කහටගස්දිගිලිය අඩවි වන කාර්යාලයේදී 1973 මැයි මස 10 වෙනි දින පෙ. ව. 10 ට උතුරු මැද දිසාවේ දිසා වන නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම් කිරීමට ප්‍රථම දැව/ද්‍රව්‍ය පරීක්ෂා කර බලන ලෙස ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අයවලුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නන් වෙන්දේසිය පිළිබඳ කොන්දේසිවලට අනුකූලතාවය දැක්විය යුතුය. වෙන්දේසිය පිළිබඳ වැඩිමනත් විස්තර පහත අත්සන් කරන අය වෙතින් හෝ කහටගස්දිගිලිය අඩවි වන නිලධාරිගෙන් විමසිය යුතු වේ.

නා. සිත්තම්පලම්,
උතුරු මැද දිසාවේ දිසා වන නිලධාරී.

4–706—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

### රේගු වෙන්දේසිය

අංක 25 ශ්‍රී 2756 දරණ පාවිච්චි කරන ලද "මැසේ ෆර්ගියුසන්" ට්‍රැක්ටරය සහ අංක 55 ශ්‍රී 3833 දරණ ට්‍රේලරය ද 1973.05.14 වැනි දින පෙ. ව. 9 ට වවුනියා කච්චේරියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගැනුම්කරුවන්ට 1973.05.12 වැනි දින කාර්යාල වේලාව තුළ දී මෙම වාහන පරීක්ෂා කර බැලිය හැක. (උදේ 9 සිට 12 දක්වා)

තීන්දු කරන වැඩිම මිලෙන් සියයට පනහක් ඉල්ලුම්කරු විසින් මුදලින් තැන්පත් කළ යුතු අතර, වෙන්දේසිය අනුමත වූ දින සිට දින හතකින් වාහන ඉවත් කර නොගතහොත්, ඒවා නැවත විකුණනු ලබනවාත් මෙන්ම, ඔවුන් විසින් ගෙවන ලද මුදල රජ සන්තක කරනු ලැබේ.

1954 මැයි 28 දින පළ වූ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ සඳහන් කොන්දේසි අනුව, වෙන්දේසිය පවත්වනු ලැබේ.

එල්. පී. වික්‍රමාරච්චි,
රේගු අයකැමි, වවුනියා දිස්ත්‍රික්කය.

1973 අප්‍රේල් මස 10 වැනි දින,
වවුනියා, දිසාපති කාර්යාලයේ දීය.

4–687—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

#### පාවිච්චියට අයෝග්‍ය භාණ්ඩ විකිණීම

1973 මැයි මස 7 වෙනි දින පෙ. ව. 10 ට පහත සඳහන් පාවිච්චියට අයෝග්‍ය භාණ්ඩ බණ්ඩාරවෙල සහකාර පොලිස් අධිකාරි ගබඩාවේදී වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| | | | |
|---|---|---|---|
| 1. සපත්තු බුරුසු | ... | ... | 13 යි |
| 2. බෙලියට් බෝල අගල් 38 | ... | ... | 03 යි |
| 3. බ්ලැක්ලාවා කැප්තොප්පි | ... | ... | 30 යි |
| 4. යකඩ ඇඳන් (තනි) | ... | ... | 07 යි |
| 5. කම්බිලි | ... | ... | 42 යි |
| 6. බයිසිකල් පියුබ් සහ ටයර් | ... | ... | 04 යි |
| 7. කොනු ගුදිරි | ... | ... | 03 යි |
| 8. ගැලුම් 46 පීප්ප | ... | ... | 03 යි |
| 9. ප්ලැනල් කමිස | ... | ... | 65 යි |
| 10. ඇඳුම් කට්ටල පලස් | ... | ... | 15 යි |
| 11. ඇඳුම් කට්ටල පෙට්ටි | ... | ... | 05 යි |
| 12. ලෝහ අත් මේස් කුට්ටන් | ... | ... | 08 යි |
| 13. ගැලුම් 4 ටින් | ... | ... | 09 යි |
| 14. ගැලුමේ ටින් | ... | ... | 12 යි |
| 15. අත් පන්දු කවර් | ... | ... | 02 යි |
| 16. ලෝහ සුව්ටර් (ජේසි) | ... | ... | 58 යි |
| 17. ලෝහ දිග කලිසම් | ... | ... | 02 යි |
| 18. ලෝහ හටකබා | ... | ... | 02 යි |

1973 අප්‍රේල් මස 28 වෙනි දින පෙ. ව. 8 සිට 10 දක්වා එම භාණ්ඩ රාජකාරි වේලාව තුළ පරීක්ෂාකර බැලිය හැක.

ගැනුම්කරු විසින් එවෙලේම සම්පූර්ණ වටිනාකම මුදලින් ගෙවා තමන් මිලයට ගත් භාණ්ඩ වහාම එම ස්ථානයෙන් ඉවත් කර ගත යුතුයි.

ආර්. ඇස්. ද සිල්වා,
සහකාර පොලිස් අධිකාරි, බණ්ඩාරවෙල.

1973 අප්‍රේල් මස 07 වැනි දින,
පොලිස් කාර්යාලය,
බණ්ඩාරවෙල.

4–618—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**වල්පිට රජයේ ගොවිපලේ ප්‍රයෝජනයට ගතනොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වල්පිට රජයේ ගොවිපලට අයත් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 1973 මැයි මස 14 වෙනි දින පෙ. ව. 10 ට ඉහත සඳහන් ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසිවූ මොහොතේම සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතර වෙන්දේසිය පැවැත්වෙන දින ප. ව. 3.30 ට පෙර සියලුම භාණ්ඩ ගැනුම්කරුවන් විසින් ඉවත් කර ගතයුතුය.

3. වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ ලේඛණයක් මෙම කාර්යාලයේ හා එම ගොවිපලේ දැන්වීම් පුවරුවල ප්‍රසිද්ධ කරනු ලැබේ.

4. මෙම භාණ්ඩ වෙන්දේසිය පැවැත්වන දිනට පෙර දිනවලදී කාර්යාල වේලාවන් තුළදී ඉහත සඳහන් ගොවිපලේදී පරීක්ෂාකර බැලිය හැක.

ඒ. පී. ඊ. අබේසූරිය,
පරිපාලන නිලධාරි (ගො. පා. හා. නි.) කොළඹ

ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය,
තැ. පෙ. 622, පලතුරු ස◌ිහල පාර, කොළඹ 5,
1973. 4. 9.

4-613—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**1973–74 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම—1973.07.01 සිට 1974.06.30**

සියළුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන් දනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි හා 1972.10.31 දින අංක 31/3 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ (අතිවිශේෂ) පළ කරන ලද කොන්දේසිවලට යටත්ව 1973 ජූලි 1 දින සිට 1974 ජූනි 30 වැනි දින දක්වා කාලය සඳහා පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිළ දී ගැනීම සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම පහත සඳහන් උපලේඛනයේ නියම කර ඇති මුදලක් ගෙවීමෙන් පසු ඕනෑම කච්චේරියකින් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයක පිළියෙල කළ යුතුය. සෑම ටෙන්ඩරයක්ම එසේ ගෙවීම් කරනු ලැබීමෙන් ලබාගත් කච්චේරි කුවිතාන්සියක් සහ ටෙන්ඩර් කරුගේ දේපොල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකය ද අමුනා එවිය යුතුය. එකිනෙක තැබෑරුම සඳහා ටෙන්ඩර් කරන ලද මුළු මුදලින් සියයට 25 ට අඩු නොවන වත්කම් සහතිකය සමග බැඳුම් සහතිකයක් ද ඇමිනිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ත්‍රිකුණාමලයේ දිසාපති වෙතය. සෑම ටෙන්ඩරයක් ම සීල් තබන ලද කවරයක බහා, එහි වම්පස උඩ කෙළවරේ "අංක ......... දරණ රා තැබෑරුම් සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය. සීල් තබන ලද ටෙන්ඩර් සහිත කවරය (අ) කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමෙන් හෝ මෙහි පහත දක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර දිසාපතිතුමා වෙත ලැබීමට සැලැස්විය යුතුය.

4. පහත උපලේඛනයේ පරිදි 1973 මැයි මස 9 වෙනි බුද දින ටෙන්ඩර් පත් වසනු ලැබේ.

5. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතුය. සාර්ථක ලෙස ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු විකිණීමේ අයිතිය ඔහු සතු බව ප්‍රකාශයට පත් කළ වහාම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා විකිණීමේ කොන්දේසි නිසි ලෙස ඉටු කිරීමේ ඇප තැන්පත් මුදල වශයෙන් දෙමසක රේන්ද කුලියට වැඩි මුදලක් ත්‍රිකුණාමලය දිසාපති වෙත ගෙවිය යුතුය.

6. යම් ටෙන්ඩරකරුවෙක් ඔහුට වරප්‍රසාද හිමිවූ බවට ප්‍රකාශ කරනු ලැබුවායින් පසුව විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට හෝ තැන්පත් මුදල් ගෙවීමට හෝ ප්‍රතික්ෂෙප කළහොත් එය ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල ඔහුට අහිමි වනවාත් හැර සියළුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන් කොන්දේසි කඩ කරන ටෙන්ඩර්කරුවන්ගේ නාම ලැයිස්තුවට ඔහුගේ නම ඇතුළත් කිරීමටත් හේතු වනවා ඇත. සාර්ථක ටෙන්ඩර්කරු විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව මේ විශේෂත්වයට යටත්ව, සෙසු ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත. ටෙන්ඩර් පත්‍ර ලබාගෙන ටෙන්ඩර් ඉදිරිපත් නොකළ යම් තැනැත්තකුගේ ටෙන්ඩර් ඇපය නිදහස් කරනු ලබන්නේ ඒ සඳහා ඉල්ලුම්පත්‍රයක් කිසිවක් නොලියන ලද ටෙන්ඩර් පත්‍ර සමඟ ආපසු ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනයේ සිට දින දහහතරක් ඉකුත්වීමට පෙර දිසාපතිට ඉදිරිපත් කරනු ලැබුවහොත් පමණි.

7. වැඩි විස්තර ත්‍රිකුණාමලය කච්චේරියෙන් ලබාගත හැක.

8. මීලඟ රේන්ද කාලය තුළදී දනට තැබෑරුම් පවතින ස්ථානම තැබෑරුම් පවත්වාගෙන යාම සඳහා ප්‍රයෝජනයට ගත හැකි වේ යයි සහතික කළ නොහැකිය.

9. 1973–74 වර්ෂය සඳහා අනුමත රා තැබෑරුම් ලැයිස්තුව සහ ඉහත සඳහන් කළ උපලේඛනයද පහත සඳහන් අයුරු වේ.

**උපලේඛනය**

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | ප්‍රාදේශීය පළාත | විවෘත කරන වේලාව පෙ. ව. | වසන වේලාව ප. ව. |
|---|---|---|---|---|
| 1 | කොට්ඨාශ අංක 2 ත්‍රිකුණාමලය පළාත් ආණ්ඩු සභාව | විල්ගුන්ඩි | 8.00 | 8.00 |
| 2 | කොට්ඨාශ අංක 9 ත්‍රිකුණාමලය පළාත් ආණ්ඩු සභාව | උප්පුවෙලි | 8.00 | 8.00 |
| 3 | තෙකිලිතු තම්පලාකමම් පත්තු | තෙකිලිතු | 8.00 | 6.30 |
| 4 | කඩ්ඩුකුලම් පත්තු | නිලාවෙලි | 8.00 | 6.30 |

**ටෙන්ඩර් තැන්පත් සහ ටෙන්ඩර් වසන වේලාව**

| තැබෑරුම් අංකය | ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් | ටෙන්ඩර් වසන වේලාව පෙ.ව. |
|---|---|---|
| 1 | 3,000 | 9.30 |
| 2 | 3,000 | 10.00 |
| 3 | 1,500 | 10.30 |
| 4 | 1,500 | 11.00 |

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 අප්‍රේල් මස 11 වැනි දින,
ත්‍රිකුණාමලය, දිසාපති කාර්යාලයේ දී ය.

4-637—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

### මන්නාරම් දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම 1973 ජූලි මස 1 සිට 1974 ජූනි මස 30 දක්වා කාලය සඳහා

1973 ජූලි මස 1 ද සිට 1974 ජූනි මස 30 වැනි දින දක්වා වූ කාලය සඳහා මන්නාරම් දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට) සුරාබදු බලපත්‍රයන්ට අදල පොදු කොන්දේසි මාලාවට යටත්ව, 1973/74 කාලය සඳහා අංක (31/3)—1972.10.31 වැනි දින ප්‍රකාශයට පත් ගැසට් පත්‍රයේ සඳහන් උප කොන්දේසිවලට අනුකූලව ටෙන්ඩර් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

2. මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර 1973/74 වර්ෂය සඳහා මන්නාරම දිස්ත්‍රික්කයේ රා රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩරය යි සඳහන් කර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති දිනයට සහ වේලාවට කලින් එවිය යුතුය.

3. එක් එක් තැබෑරුම සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුයි. තවද, එකී අයෙකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩරයකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකට සාමූහිකව ටෙන්ඩරයක් එවිය හැකිය.

4. පහත සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණියහොත්,

(ආ) සෑම ටෙනඩර් පත්‍රයකටම ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයේ මුල් පිටපතද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන අවස්ථාවල, මෙහි පහත දක්වා ඇති පරිදි, මුල්පිටපත සහ එහි විධිමත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුයි. එවැනි වත්කම් සහතික යක් අමුණා නොමැත්තාවූද, ටෙන්ඩරයේ දක්වෙන මුදල් ප්‍රමාණයෙන් සියයට විසි පහකට (25%) අඩු වටිනාකමක් ඇති වත්කම් සහ තිකයේ අමුණා ඇත්තාවූ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමඟ වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇත්නම්, අනිකුත් ටෙන්ඩර්වලට එම සහතිකයේ, සහතික පිටපත අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම්, සහතිකයේ අමුණා යැවූ ටෙන්ඩරයට අදල තැබෑරුමේ පිහිටීම, නම සහ අංකය දක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ මන්නාරම දිසාපති කායර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ මන්නාරම දිසාපතිතුමාට හෝ එතුමාගේ කාර්යාලය සහකාරතැනට හෝ පුද්ගලිකව භාරදීම කළහැකි නමුත්, ටෙන්ඩර් පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරය එවනු ලැබූ තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළ යුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කළ යුතුයි.

6. (අ) සෑම ටෙන්ඩර්කරුවෙක්ම එක් එක් තැබෑරුම සම්බන්ධයෙන් පහත දක්වා ඇති පරිදි මුදල් තැන්පත් කළ යුතුයි. තැන්පත් කළයුතු මුදල් මෙම කච්චේරියේ හෝ අන් කච්චේරියක තැන්පත් කළ යුතුයි. තැන්පත් මුදල සම්බන්ධ සම්බන්ධයෙන් කච්චේරි කුවිතාන්සිය ටෙන්ඩරයට අමුණා එවිය යුතුයි.

(ආ) සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය රා රේන්දය මිළයට ගනු ලැබූ අය ලෙස ප්‍රකාශයට පත් කළ වහාම මෙහි විකිණීම පිළිබඳව කොන්දේසිවලට අත්සන් තැබීමට අ පොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල අහිමි වනු ඇත.

(ඉ) සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු විසින් ගිවිසුමකට අත්සන් කළ පසු අසාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

7. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය මන්නාරම දිසාපතිතුමා සතුය.

8. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ටෙන්ඩර්කරු රා රේන්දය මිළයට ගත් අය ලෙස ප්‍රකාශයට පත් කළ වහාම මන්නාරම දිසාපති තුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසාපති තුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර් කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසි මාලාවකට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

9. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම පවත්වා ගෙන යාමට තෝරා ගත් ස්ථානය දිසාපති තුමාට දැනුම් දිය යුතු අතර, ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබාගත යුතුයි.

10. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා මන්නාරම දිසාපති කායර්‍යාලයට ලියා විමසන්න.

#### උපලේඛනය

මන්නාරම දිස්ත්‍රික්කයේ රා තැබෑරුමේ 1973 ජූලි මස 1 සිට 1974 ජූනි මස 30 දක්වා

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටවිය යුතු ප්‍රදේශය | තැන්පත් කළ යුතු මුදල රු. | ශ. | ටෙන්ඩර භාරගන්නා අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|
| 1 | මන්නාරම | මන්නාරම | 2,000 | 0 | 1973.05.04 පෙ.ව. 10.00 |
| 2 | මන්නාරම | තලෙයිමන්නාරම | 1,500 | 0 | 1973.05 04 පෙ.ව. 10.20 |
| 3 | මන්නාරම | පේසාලේ | 1,500 | 0 | 1973.05.04 පෙ.ව. 10.40 |
| 4 | මන්නාරම | උයිලන්කුලම් | 1,500 | 0 | 1973.05.04 පෙ.ව. 11.00 |
| 5 | මාන්තේ | කඩ්ඩාඩිවායල් | 500 | 0 | 1973.05.04 පෙ.ව. 11.20 |
| 6 | මුසලි | වන්කාලෙයි | 1,000 | 0 | 1973.05.04 පෙ.ව. 11.40 |
| 7 | මුසලි | අරිප්පු | 1,000 | 0 | 1973.05.04 දහවල් 12.00 |
| 8 | මන්නාරම | මාලුවාඩි | 1,500 | 0 | 1973.05.04 ප.ව. 12.20 |

එස්. කතිර්කාමනාදන්,
මන්නාරම දිසාපති.

1973.04.06 වෙනි දින,
මන්නාරම දිසාපති කායර්‍යාලයේ දීය.

4-694—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය
### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් | ... | 73.04.06 සිකුරාද | ... | 73.03.28 බදාද | දවල් 12.00 |
| | | 73.04.11 බදාද | ... | 73.04.04 බදාද | දවල් 12.00 |
| | | 73.04.19 බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදාද | දවල් 12.00 |
| | | 73.04.27 සිකුරාද | ... | 73.04.18 බදාද | දවල් 12.00 |
| මැයි | ... | 73.05.04 සිකුරාද | ... | 73.04.25 බදාද | දවල් 12.00 |
| | | 73.05.11 සිකුරාද | ... | 73.05.02 බදාද | දවල් 12.00 |
| | | 73.05.18 සිකුරාද | ... | 73.05.09 බදාද | දවල් 12.00 |
| | | 73.05.25 සිකුරාද | ... | 73.05.15 අඟහරුවාද | දවල් 12.00 |
| ජූනි | .. | 73.06.01 සිකුරාද | ... | 73.05.23 බදාද | දවල් 12.00 |
| | | 73.06.08 සිකුරාද | ... | 73.05.30 බදාද | දවල් 12.00 |
| | | 73.06.14 බ්‍රහස්පතින්ද | ... | 73.06.06 බදාද | දවල් 12.00 |
| | | 73.06.22 සිකුරාද | ... | 73.06.13 බදාද | දවල් 12.00 |
| | | 73.06.29 සිකුරාද | ... | 73.06.20 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්.
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින.

ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.